**ජාතික චිත්‍රපට සංවර්ධන අරමුදල - 2015**

**-------------------------------------------------**

ජාතික චිත්‍රපට සංවර්ධන අරමුදලේ 2015 දෙසැම්බර් 31 දිනට ශේෂපත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂ සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 47 දරන ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථා පනතේ 5 වගන්තිය සහ 61 වගන්තිය යටතේ සාදන ලද 1994 අංක 1 දරන ජාතික චිත්රපට සංවර්ධන අරමුදල් නියෝග මාලාවේ අංක 12 දරන නියෝගය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (3) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. යථෝක්ත මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවෙහි දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

**-------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

**---------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට ( ISSAI 1000 -1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලැසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටින්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම්කිරීම පිණිස අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අරමුදලේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**-------------------------------------------**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2.** **මූල්‍ය ප්‍රකාශන**
------------------

**2.1** **තත්ත්වාගණනය කළ මතය**
------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට ජාතික චිත්‍රපට සංවර්ධන අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2** **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**
-----------------------------------------

**2.2.1** **ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති**
-------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 01
---------------------------------------------

(i) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති මගින් අවශ්‍ය කෙරෙන හෝ අවසර දී ඇති විටෙක හැර ආදායම් හා වියදම් හිලව් නොකළ යුතු වුවත්, 2015 වර්ෂය තුළදී විදේශ චිත්‍රපට නිෂ්පාදකයින් විසින් ශ්‍රී ලංකාව තුළ චිත්‍රපට නිෂ්පාදනයේදී ලැබී තිබූ රු.530,000 ක ආදායමින් චිත්‍රපට අධීක්ෂක නිලධාරීන්ට ගෙවූ රු.373,000 ක වියදම හිලව් කර ශුද්ධ ප්‍රතිඵලය වූ රු.157,000 පමණක් ආදායමක් ලෙස ගිණුම් ගත කර තිබුණි.

(ii) මූල්‍ය ප්‍රකාශනවල මූලිකාංගයක් වන හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශනය, මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර නොතිබුණි

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07
---------------------------------------------

ස්ථාවර වත්කම් ක්ෂය කිරීම් ප්‍රතිපත්තිය මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

**2.2.2** **ගිණුම්කරණ අඩුපාඩු**
---------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ජාතික චිත්‍රපට සංවර්ධන අරමුදල 2007 වර්ෂයේදී ඉන්දියාවේ පෞද්ගලික රසායනාගාරයක් සමඟ එක්වී චිත්‍රපටයක් නිෂ්පාදනය කිරීමට සැලසුම්කර, ඒ සඳහා මූලික වියදම් ලෙස රු.200,000 ක් වැය කිරීමෙන් පසුව එය ක්‍රියාත්මක නොකර අතහැර දමා ඇතත් එම වියදම අදාල වර්ෂයේ වියදමක් ලෙස ලියාහැරීමකින් තොරව දිගින් දිගටම තොග ශේෂයක් ලෙස දක්වා තිබුණි.

(ආ) විගණනයේදී සිදුකරන ලද ගණනය කිරීම් අනුව සමාලෝචිත වර්ෂය තුළ මුදලින් ලද ආයෝජන ආදායම රු.2,476,791 ක් වූ නමුත් මුදල් ප්‍රවාහ ප්‍රකාශනය තුළ එය රු.2,725,981 ක් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ඇ) 2014 වර්ෂයේ රු.292,174 ක් හා 2015 වර්ෂයේ රු.307,174 ක් වශයෙන් ස්ථාවර තැන්පතු පොලී වෙනුවෙන් රඳවාගත් බදු මුදල්, වර්ෂයට අදාල වියදමක් ලෙස සටහන් නොකර ලැබිය යුතු ශේෂ ලෙස පෙන්නුම් කර තිබුණි.

(ඈ) ආයතනය විසින් රාජ්‍ය බැංකුවක පවත්වාගෙන යන ගිණුමේ 2015 ජනවාරි සිට 2015 දෙසැම්බර් දක්වා රු.20,000 ක හඳුනා නොගත් බැර ශේෂයක් පැවති අතර එම මුදල් හඳුනා ගැනීම සඳහා කටයුතු කර නොතිබුණි.

**2.2.3 විගණනය සඳහා සාක්ෂි නොවීම**

**-------------------------------------**

2015 වර්ෂයේ කොළඹ ජාත්‍යන්තර සිනමා උළෙල පැවැත්වීම සඳහා අරමුදල වෙනුවෙන් ජාතික චිත්‍රපට සංස්ථාව වැය කර ඇති රු.5,000,000 ක ගෙවීම පිළිබඳ තහවුරු කිරීමේ ලේඛන කිසිවක් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

**2.3. නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

**-----------------------------------------------------------------------**

1996 ඔක්තෝබර් 24 දිනැති අංක 946/9 දරන චිත්‍රපට සංවර්ධන අරමුදල සම්බන්ධ ගැසට් පත්‍රයේ නියෝග අංක 06(ඈ) ප්‍රකාරව ණය මුදල් ආපසු ගෙවීම ප්‍රමාද වන්නේ නම් ඒ සඳහා අයවිය යුතු අධිභාරයන් නිශ්චය කර අයකර ගතයුතු වුවත් සමාලෝචිත වර්ෂය දක්වා ප්‍රදානය කළ රු.74,336,614 ක ණය මුදල් සම්බන්ධයෙන් ඒ අනුව කටයුතු කර නොතිබුණි.

**3. මූල්‍ය සමාලෝචනය**

**---------------------**

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

**----------------**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය සඳහා වූ අරමුදලේ මූල්‍ය ප්‍රතිඵලය රු.384,475 ක අතිරික්තයක් වූ අතර එයට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.679,301 ක් විය. මේ අනුව ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී අරමුදලේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 1,063,776 ක වර්ධනයක් නිරීක්ෂණය විය. සමාලෝචිත වර්ෂයේදී චිත්‍රපට උළෙල වියදම් රු.5,000,000 කින් වැඩිවුවද මූල්‍ය හා අනිකුත් වියදම් රු.5,914,483 ක පහත වැටීම සහ චිත්‍රපට කුලී දායකත්වය රු.541,832 කින් වර්ධනය වීම මෙම වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**4. මෙහෙයුම් සමාලෝචනය**

**---------------------------**

**4.1 කාර්යසාධනය**

**------------------**

1971 අංක 47 දරන ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව පනත ප්‍රකාරව දේශීය චිත්‍රපට කර්මාන්තය සඳහා අවශ්‍ය උපකරණ හා අමුද්‍රව්‍ය සැපයීම, චිත්‍රපට දේශීය වශයෙන් නිෂ්පාදනය සඳහා උරදීම, උසස් ප්‍රමිතීන් සහතික කිරීම හා ආධාර අනුබල දීම, නරඹන්නන්ගේ හා සිනමාශාලාවල සේවකයින්ගේ පහසුව හා ප්‍රවේශම සඳහා අවශ්‍ය ප්‍රමාණවත් පහසුකම් සිනමාශාලා සපයන බව සහතික කිරීම, කලාකරුවන්ට සහ කාර්මික ශිල්පීන්ට ශිෂ්‍යත්ව ලබාදීම හෝ පුහුණු වැඩසටහන් ඇතිකිරීම, අවුරුදු පහක් හෝ ඊට වැඩි කාලයක් නොකඩවා දේශීය කර්මාන්තයේ නියැලී සිටින සහ චිත්‍රපට දහයකට අඩු නොවන ගණනක කටයුතු සම්පූර්ණ කර ඇති වෘත්තීය කාර්මික ශිල්පීන්ට තමන්ගේ නිපුණතා වැඩිකර ගැනීමට සහ දියුණුකර ගැනීමට ණය දීම අරමුදලේ ප්‍රධාන අරමුණු විය.

ඉහත අරමුණු ඉටුකර ගැනීම සම්බන්ධ පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

සමාලෝචිත වර්ෂය තුළ චිත්‍රපට 2 ක් නිෂ්පාදනය සඳහා ණය ලබාදීමට රු.මිලියන 10 ක් වෙන්කර තිබුණද පාලක මණ්ඩලයක් නොමැති නිසා එම තීරණ ක්‍රියාත්මක වී නොමැති අතර කලාකරුවන්ට හා කාර්මික ශිල්පීන්ට ශිෂ්‍යත්ව ලබාදීම හෝ පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, අවුරුදු පහක් හෝ ඊට වැඩි කාලයක් නොකඩවා දේශීය කර්මාන්තයේ නියැලී සිටින සහ චිත්‍රපට දහයකට අඩු නොවන ගණනක කටයුතු සම්පූර්ණ කර ඇති වෘත්තීය කාර්මික ශිල්පීන්ට තමන්ගේ නිපුණතා දියුණු කර ගැනීමට ණය දීම ආදී අරමුණු ඉටු කර ගැනීම සඳහා සමාලෝචිත වර්ෂය තුළදී කටයුතු කර නොතිබුණි.

**4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්**

සමාලෝචිත වර්ෂය අවසාන වනවිට වර්ෂ 5 ත් 13 ත් අතර කාල පරාසයක සිට පවත්නා රු.67,007,500 ක් වූ ණය ශේෂ අයකර ගත නොහැකි ණය ලෙස හඳුනාගෙන තිබුණි. 2015 වර්ෂය තුළ අයකරගෙන ඇත්තේ මුළු ණය ප්‍රමාණයෙන් රු. 531,101 ක් හෙවත් සියයට 0.71 පමණක් වන අතර ඉතිරි ණය අයකර ගැනීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

**4.3 මෙහෙයුම් ක්‍රියාකාරකම්**

1994 අංක 01 දරන ජාතික චිත්‍රපට සංවර්ධන අරමුදල් අංක 04/166 නියෝග මාලාවේ 5.1 ඡේදය අනුව අරමුදලේ කළමනාකරණය සහ පාලනය සඳහා පාලක මණ්ඩලයක් පත්කළ යුතු වුවත් 2012 වර්ෂයෙන් පසු පාලක මණ්ඩලයක් පත්කර නොතිබුණි.

**5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

**5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය අනුව අදාල ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන විගණනයට ඉදිරිපත් කළයුතු වුවත්, ආයතනය විසින් 2015 වර්ෂයට අදාල ගිණුම් විගණනයට ඉදිරිපත් කරන ලද්දේ 2016 මැයි 11 දින එනම් දින 72 ක ප්‍රමාදයකින් පසුවය.

**5.2 සංයුක්ත සැලැස්ම**

සංවර්ධන අරමුදල පාර්ලිමේන්තු පනතක් යටතේ වූ නියෝග මාලාවක් පදනම් කරගෙන ස්ථාපිත කරන ලද ස්වාධීන ආයතනයක් වුවත් 2015 වර්ෂය සඳහා සංයුක්ත සැලැස්මක් සකස් කර නොතිබුණි.

**5.3 ක්‍රියාකාරි සැලැස්ම**

2015 වර්ෂය වෙනුවෙන් ක්‍රියාකාරි සැලැස්මක් සකස් කර නොතිබුණි.

**5.4 අභ්‍යන්තර විගණනය**

මුදල් රෙගුලාසි 133 හා 134 විධිවිධාන අනුකූලව අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

**6. පද්ධති හා පාලනයන්**

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු පිළිබඳව අරමුදලේ සභාපතිවරයාගේ අවධානයට වරින්වර යොමුකරන ලද පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතු වේ.

| | පද්ධති හා පාලන කෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) | කාර්ය මණ්ඩල පරිපාලනය | කාර්ය මණ්ඩලය සඳහා වැඩ බෙදා හැරීමක් සිදු කර නොතිබීම. |
| (ආ) | ණය ලබා දීම හා අයකර ගැනීම. | ණය ලබා දීමේ හා අය කර ගැනීමේ රීති මාලාව යාවත්කාලීන කර නොතිබීම හා හිඟ ණය අයකර ගැනීමට කටයුතු කර නොතිබීම. |